# ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන (NTDND & EI) ව්‍යාපෘතිය

# ඇබෑර්තු - රියදුරු

## මාස 12 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත

ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයට රියදුරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් හා අත්දැකීම්ලත් ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා:

## රියදුරු - ඇබෑර්තු 03

- අ.පො.ස. (සා. පෙළ) විභාගයේ අවම විෂයන් 6 ක් එකවරකදී සමත්වී තිබිය යුතුය.
- අයදුම්කරුගේ අවම උස අඩි 5 අඟල් 3 ක් විය යුතුය.
- අවම වශයෙන් D,C සහ C1 වර්ගයේ වාහන ධාවනය කිරීම සඳහා මෝටර් රථ ගමනාගමන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් ඇති ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.
- රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
- අයදුම්කරුවන් දිවා හා රාත්‍රී රාජකාරියට ශාරීරිකව යෝග්‍ය විය යුතුය.
- තෝරාගත් අයදුම්කරුවන්, දර්ශනය සහ ශ්‍රවණය සඳහා මෑතකාලීන පරීක්ෂණ වාර්තා (රජයේ රෝහල්වලින් ලබා ගත්) සම්මුඛ පරීක්ෂණ/රියදුරු පරීක්ෂණය අතරතුර ඉදිරිපත් කළ යුතුය.
- අදාල ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් ලබාගත් පොලිස් වාර්තාව සහ ග්‍රාම නිලධාරී සහතික ඇතුළුව වෙනත් සහතික.

| | |
|---|---|
| **වයස් සීමාව** | : අයදුම්පත යොමු කරන අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය. |
| **වේතනය** | : 2019 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට යටත්වේ. |
| **තෝරා ගැනීම** | : සුදුසුකම්ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ / රියදුරු පරීක්ෂණ මගින් |
| **කාර්ය ස්ථානය** | : ව්‍යාපෘති කාර්යාලය, ටොරින්ටන් – දෙහිවල හා බත්තරමුල්ල වැඩබිම් (තෝරාගත් රියදුරන් ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් අනුව වැඩබිම් තුළ සේවය කළ යුතුය) |

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :** 2021 මැයි 07 දින.

**සේවයට අදාළ කොන්දේසි:**

- සේවය සඳහා බඳවාගැනීම මාස දෙළහක (12) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.
- මෙම ව්‍යාපෘතියේ ඉදිරි අවශ්‍යතාවය මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරනු ලැබිය හැකිය. සේවය දීර්ඝ කිරීමේ හෝ අවසන් කිරීමේ පූර්ණ අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය සතුවේ.
- ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයන් බඳවා ගැනීමකදී සුදුසුකමක් ලෙස මෙම පත්වීම සලකනු නොලැබේ.

**වෙනත් ප්‍රතිලාභ:**

1. තෝරාගත් අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා හිමිකම් දරන අතර ඒ සඳහා වැටුපෙන් 10% කින් දායක වියයුතු අතර ව්‍යාපෘතිය මගින් 15% ක දායකත්වයක් දරනු ඇත.
2. සේවක භාරකාර අරමුදල (ETF) සඳහා වැටුපින් 3% ක දායකත්වයක් ව්‍යාපෘතිය මගින් දරනු ඇත.

ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් විසින් තම සම්පූර්ණ නම, පුද්ගලික සහ රාජකාරී ලිපිනය, තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තර හා දුරකථන අංක සහිත සම්පූර්ණ අයදුම්පත්‍රයක් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"රියදුරු ඇබෑර්තු - NTDND & EI ව්‍යාපෘතිය"** යනුවෙන් සටහන් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළයුතු අතර, යම් හෙයකින් තෝරාගතහොත් නිදහස් කළ හැකිද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා:**

**ව්‍යාපෘති අධ්‍යක්ෂක (NTDND & EI ව්‍යාපෘතිය)**

**දු. අංක : 011-2589814 ෆැක්ස් : 011-2081690**

**ව්‍යාපෘති අධ්‍යක්ෂක - NTDND & EIP**
**ලංකා විදුලිබල මණ්ඩලය**
**අංක 18, කොනිස්ටන් පෙදෙස,**
**කොළඹ 07.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලිබලයෙන් සසිරිමත් දිවියක්**

Source: Dinamina, Daily News (2021.04.22)